සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

# වර්ෂ අවසාන ඇගයීම - 2012
# வருட இறுதிக் கணிப்பீடு - 2012
# Year End Assessment - 2012

| | | |
|---|---|---|
| 7 ශ්‍රේණිය<br>தரம் 7<br>Grade 7 | සංගීතය (පෙරදිග) I හා II පත්‍රය<br>சங்கீதம் (கீழைத் தேய) பகுதி I - II<br>Music (Oriental) Paper I & II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50 කි. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50 කි.

ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

01.) ස්වර සප්තකයේ යෙදෙන අචල ස්වර මොනවාද?
1 ම , ප    2 ස , ප    3 ම , ස    4 ප , රි

02 )ස්වර සප්තකයේ යෙදෙන සියලුම ස්වර ගණන කීයද?
1 8 කි    2 12 කි    3 7 කි    4 13 කි

03 )ත්‍රිවිධ සප්තකය පිළිවෙලින්
1 මන්ද්‍ර,මධ්‍ය,උච්ච වේ  2 මධ්‍ය,මන්ද්‍ර,උච්ච වේ 3  උච්ච, මධ්‍ය ,මන්ද්‍ර වේ 4  මධ්‍ය, උච්ච ,මන්ද්‍ර වේ

04) කෙළි ගීත විශේෂයක් වන්නේ
1 ගොයම් ගී    2 ළමා ගී    3 ලේමර ගී    4 ස්වර ස්ථාපන ගී

05) මාත්‍රා තුනෙන් තුනට බෙදෙන රබන් පදයකි

1 උඩරට මැණිකෙට පට කුඩ දෙක දෙක    2 අත්තක රතුමල් අත්තක සුදු මල්
3  උඩපල ගත්තත් වට්ටක්කා    4 පුරංචි බතල ගැට තුඹ කොළ

ප්‍රශ්න අංක 06 සිට 08 දක්වා ප්‍රශ්න වලට පිළිතුර සැපයීමේදී වරහන තුළ දී ඇති වචන වලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න

( බැති ගීත, සිම්ෆනි,උපදේශාත්මක)

06) කරුණාව සමග හොඳ හිත පතුරන්න සැම කෙරේ යන ගී පාදය ................................ ගීත ගණයට අයත් වේ

07) සිරිපා සමයේ ගයන ගීත........................නම් වේ

08) යම් කිසි තේමාවක් මත වාදක මණ්ඩලයක් සඳහා නිර්මාණය වූ සංගීත රචනාවක් ලෙස .................................. හැඳින්වේ

A කොටසට ගැළපෙන නිවැරදි වචනය B කොටසින් තෝරා යා කරන්න

| | A | B |
|---|---|---|
| 09) | සුෂිර භාණ්ඩයකි | රබාන |
| 10) | ස රි ග ම ප ධ නි ස̇ | C,D,E,F |
| 11) | සම් වලින් නිපද වූ භාණ්ඩයකි | බට නලාව |
| 12) | Do,Re,Mi,Fa | ආරෝහණ |

පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණද වැරදි නම් (x) ලකුණද සදහන් කරන්න

13) ධා ධී නා/ ධා තූ නා ලෙස යෙදෙන හින්දුස්ථානි තාල පදය දාදරා තාලයට අයත් වේ ( )

14) සංගීතයේ මාධ්‍ය නාදය නම් නර්තනයේ මාධ්‍ය වර්ණ වේ ( )

15) අපරදිග සංගීතයේ C,A ස්වර සංකේත පෙරදිග සංගීතයේ ස , ධ ස්වර සංඥා වේ ( )

16) සිතාරය නැමති සංගීත භාණ්ඩය වාදනය කිරීමට මිස්රාබය යොදා ගනී ( )

කෙටි පිළිතුරු සපයන්න

17) බටහිර සංගීතයේ යෙදෙන **flat** සහ **sharp** සලකුණු ලියන්න

18) බටනලාවේ සියලුම සිදුරු වැසූ විට ලැබෙන ස්වරය වන්නේ කුමද්ද?

19) සරි සරිග, රිග රිගම ලෙස දැක්වෙන ස්වර රටාවේ 4 වන පියවර ලියා දක්වන්න


20) ස්වර පුවරු වාද්‍ය භාණ්ඩ දෙකක් ලියන්න

(1X20 - ලකුණු 20)

<u>11 කොටස</u>

කැමති ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න

01)පහත දැක්වෙන ස්වර පුවරුව ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න




1 .මෙම ස්වර පුවරුවේ කලු පැහැති යතුරු වලින් දැක්වෙන ස්වර පෙරදිග සංගීතයේ ස්වර සංඥා වලින් ලියා දක්වන්න

(ලකුණු 2 ½)

11 සුදු පැහැති යතුරුවලින් දැක්වෙන 1,3,5,6,8,10,12 ස්වර බටහිර සංගීතයේ ස්වර සංඥා වලින් ලියා දක්වන්න

(ලකුණු 3 ½)

111 අංක 3,6,8,12 ස්වර වලට අයත් බටහිර සංගීතයේ ගායනය සඳහා යොදගන්නා ස්වර නාම ලියා දක්වන්න

(ලකුණු 4)

02) 1 ඔබගේ විෂය නිර්දේශයේ අඩංගු උපදේශාත්මක ගීතයක ස්ථායි කොටස ලියා දක්වන්න


(ලකුණු 2)

11 ඔබ උගත් ස්වර ස්ථාපන ගීතයක ගීත ස්වර ප්‍රස්ථාරයක් තාලානුකූලව ප්‍රස්ථාර කරන්න

(ලකුණු 6)

111 රබන් ගීතයක් හෝ දරු නැළවිලි ගීතයක් ලියනන (ලකුණු 2)


03 )1 පහත දැක්වෙන්නේ වයලීනයක රූප සටහනකි.එහි කොටස් 6 ක් නම් කරන්න (ලකුණු ½ x 6=3)



11 මෙම ස්වර වාද්‍ය භාණ්ඩය අයත්වන පවුලේ ඉතිරි සාමාජිකයන් තිදෙනාගේ නම් ලියන්න (ලකුණු 1x3=3)

111 වයලීනයේ තත් බටහිර ක්‍රමයට සූසර කිරීමේ දී නම් කරන ආකාරය පිළිවෙලින් ලියන්න (ලකුණු 4)

04) පහත දැක්වෙන රූප සටහන ඇසුරු කර ගනිමින් පිළිතුරු සපයන්න




ඉහත රූප සටහනේ දැක්වෙන

1 ගැමි නාටක සම්ප්‍රදායේ නම කුමක්ද? (ලකුණු 1)

2 මෙම නාටකයේ රඟන චරිත 2ක් ලියන්න (ලකුණු 2)

3 මෙම නාට්‍ය සම්ප්‍රදාය බහුලව පවතින ප්‍රදේශ 2ක් ලියන්න (ලකුණු 2)

4 යොදාගත් සංගීත භාණ්ඩ 2ක් නම් කරන්න (ලකුණු 2)

5 මෙම ගැමි නාටකයෙන් ඔබ උගත් කවියක් ලියා දක්වන්න (ලකුණු 3)

05) 1 පහත දැක්වෙන ගී පාද අයත් වන්නේ සමග්‍රහයටද අවග්‍රහයටද විෂමග්‍රහයටදැයි නම් කරන්න (ලකුණු 4)

(අ) අයන්න කියන්න ලොවටම ඇහෙන්න

(ආ) හෙළ ජාතික අභිමානේ

(ඇ) සැලළිහිණි කොවුල් හඬ රැව් දෙන්නා

(ඈ) අම්මා සඳකි මම ඒ ලොව

11 පහත දැක්වෙන වචන කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 2x3=6)

(අ) සමග්‍රහ

(ආ) විෂම ග්‍රහ

(ඇ) අව ග්‍රහ